# ජාතික රාජ්‍ය සභාවේ
# 1973 අංක 5 දරන
# ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 5 දරන
ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 70/70.

**ශ්‍රී ලංකාවෙහි පුවත් පත්වලට අදාළ කරුණු විධිමත් කිරීමට හා ඒ කරුණු සම්බන්ධයෙන් උපදෙස් දීමට ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලයක් පත් කිරීම සඳහා ද ඇතැම් කරුණු පුවත් පත්වල මුද්‍රණය කිරීමට හෝ පළ කිරීමට අදාළ වැරදි විමර්ශනය කිරීම සඳහා ද ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. — *ලුහුඩු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.*

## I වන කොටස

## ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලය

2. (1) ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලය යනුවෙන් හැඳින්විය යුතු වූත් මේ පනත යටතේ තත් කාලයෙහි මණ්ඩලයේ සාමාජික යන්ව සිටින තැනැත්තන්ගෙන් සමන්විත වූත් (මේ පනතෙහි "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයක් විය යුතු ය. — *ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලය පිහිටුවීම.*

(2) (1) වන උපවගන්තියෙන් මණ්ඩලයට දෙන ලද නමින් මණ්ඩලය සංස්ථාවක් විය යුතු ය. සංස්ථාවට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එකී නමින් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි විය යුතු ය.

(3) සංස්ථාවක් වශයෙන් මේ පනත යටතේ ක්‍රියා කිරීමේ කාර්යය සඳහා—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම, සතුව සිටීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම හා විකිණීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම ද ;

(ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය වන සියලු ගිවිසුම් හෝ එකඟවීම් මණ්ඩලය විසින් ම හෝ මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් හෝ ඇති කර ගැනීම, ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ද

මණ්ඩලය විසින් කළ හැකි ය.

1—ජේ 17381—10,425 (72/10)

මණ්ඩලයේ සාමාජිකයෝ.

3. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය. එනම්:—

(අ) ප්‍රවෘත්ති අධ්‍යක්ෂ වශයෙන් තත් කාලයෙහි ධුර දරන (මේ පනතෙහි "අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තා ; සහ

(ආ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජික යන් හය දෙනෙක්. මොවුන්ගෙන්,

(i) එක් තැනැත්තකු ක්‍රියාකාරී පත්‍ර කලාවේදීන් නියෝජනය කරන තැනැත්තකු විය යුතු අතර, ශ්‍රී ලංකාවේ පුවත් පත් කලාවේදීන්ගේ සංගම් විසින් නම් කරනු ලබන හත් දෙනකුට නොවැඩි මූල මණ්ඩලය කින් ඔහු තෝරා ගත යුතු ය. තවද,

(ii) එක් තැනැත්තකු පුවත් පත් ව්‍යාපාරයේ සේවකයන් ගේ සම්බන්ධතා නියෝජනය කරන තැනැත්තකු විය යුතු අතර, ඒ සේවකයන්ගේ ලියා පදිංචි කළ එක් එක් වෘත්තිය සමිතිය විසින් නම් කරනු ලබන තිදෙනකුට නොවැඩි මූල මණ්ඩලවලින් ඔහු තෝරා ගත යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අතු රෙන් එක් තැනැත්තකු මණ්ඩලයෙහි සභාපති ලෙස නම් කළ යුතු ය.

(3) ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකුව සිටින හෝ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු බවට පත් වන කිසිදු තැනැත්තකු මණ්ඩල යේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එහි සාමාජික යකු ලෙස ධුර දරමින් සිටීමට සුදුසු නොවිය යුතු ය.

අධ්‍යක්ෂ නොවන මණ්ඩලයේ සාමාජික යන්ගේ ධුර කාලය.

4. (1) අධ්‍යක්ෂ නොවන මණ්ඩලයේ සෑම සාමාජිකයකුම (2) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත් ව අවුරුදු තුනක කාල සීමාවක් ධුරය දැරිය යුතු අතර, ඒ අනුව එම කාලසීමාව අවසානයේ දී ධුරය අත් හැරිය යුතු ය.

(2) අධ්‍යක්ෂ නොවන මණ්ඩලයේ සාමාජිකයකු, ධුර කාලසීමාව ගත වීමෙන් නොවන විට—

(අ) ඔහුගේ මරණයෙන් ; හෝ

(ආ) ඔහු අත්සන් කළ ලියවිල්ලක් ජනාධිපතිවරයා වෙත යැවී මෙන් සිය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් ; හෝ

(ඇ) ජනාධිපතිවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් ; හෝ

(ඈ) ඔහු බුන්වත් බව හෝ බංකොලොත් බව හෝ විකල වූ සිහි යෙන් යුක්ත බව නිසි බලය ඇති අධිකරණයක් විසින් තීරණය කරනු ලැබුව හොත් ; හෝ

ඔහුගේ ධුරය අත් හැරියා විය යුතු ය.

(3) මණ්ඩලයේ සාමාජිකයකු—

(අ) 3 වන වගන්තියෙහි (3) වන උපවගන්තියේ දක්වෙන නුසුදුසුකමට භාජන වී සිටින බවට ; හෝ

(ආ) සාමාජිකයකු වශයෙන් වූ ඔහුගේ කාර්යයන් ඉටු කිරීමට ස්ථිරව අපොහොසත්ව සිටින බවට ; හෝ

(ඇ) ජනාධිපතිවරයාගේ මතය අනුව වංචනික හෝ නීති විරෝධී ස්වභාවයේ වූ හෝ මණ්ඩලයේ සම්බන්ධතාවලට අහිත කර හෝ හානිකර විය හැකි හෝ යම් ක්‍රියාවක් හෝ කරුණක් හෝ දෙයක් කර ඇති බවට හෝ සිදුකර ඇති බවට

ජනාධිපතිවරයා හැඟීමට පත් වුවහොත් මිස ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු නො ලැබිය යුතු ය.

(4) කාලසීමාව ගතවීමෙන් නොව අන් ලෙසකින් ධුරය අත් හරින සාමාජිකයකු වෙනුවට මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලබන සාමාජිකයකු ඔහු අනුප්‍රාප්ත වූ සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවී ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

(5) අධ්‍යක්ෂ නොවන මණ්ඩලයේ යම් සාමාජිකයකු රෝගාතුර වීම නිසා හෝ අන් දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ඔහුගේ ධුරයෙහි යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට ජනාධිපතිවරයා විසින් මේ පනතේ ඉහත දැක්වුණු විධිවිධාන අනුව යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(6) කාලසීමාව ගත වීමෙන් ධුරය අත් හරින මණ්ඩලයේ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

5. අධ්‍යක්ෂ නොවන මණ්ඩලයේ සාමාජිකයන්ට මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගිවීම සඳහා මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයන් අනුව පාරිශ්‍රමික ගෙවිය යුතු ය. (අධ්‍යක්ෂ නොවන මණ්ඩලයෙහි අන් සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.)

6. (1) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය පස් දෙනකු විය යුතු ය. (මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය හා එවැනි රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.)

(2) මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය ද ඒ රැස්වීම්වල කටයුතු කළ යුතු ආකාරය ද මේ පනතෙහි සෙසු විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

7. මණ්ඩලයෙහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් ඇතත් මණ්ඩලයට ක්‍රියා කළ හැකි ය. (පුරප්පාඩුවක් ඇතත් මණ්ඩලයට ක්‍රියා කළ හැකි බව.)

8. මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයෙහි පරමාර්ථ— (මණ්ඩලයෙහි පරමාර්ථ.)

(1) ශ්‍රී ලංකාවේ පුවත් පත් නිදහස සුරක්ෂිත කිරීම ; ඒ නිදහසින් අයුතු ප්‍රයෝජන ගැනීම වැළැක්වීම හා සම්මත උසස් ම වෘත්තීය තත්ත්වයකට අනුකූලව ශ්‍රී ලංකාවෙහි පුවත් පත්වල ස්වරූපය ආරක්ෂා කිරීම ;

(2) කරුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශ ප්‍රවෘත්ති ලෙස පුවත්පත්වල පළ කිරීමේ සහ කරුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශ පදනම් කර ගත් අදහස් පුවත්පත්වල පළ කිරීමේ නිදහස සුරක්ෂිත කිරීම ;

(3) පුවත්පත් හා පත්‍ර කලාවේදීන් විසින් උසස් පත්‍රකලාවේදී ආචාර ධර්ම පවත්වා ගෙන යනු ලැබීම ගැන වගබලා ගැනීම හා පුරවැසි අයිතිවාසිකම් හා වගකීම් යන දෙකරුණ පිළිබඳ නිසි හැඟීමක් වඩාලීම ;

(4) පත්‍ර කලාවේදී වෘත්තියෙහි සේවයට බඳවා ගැනීමේ ක්‍රම, සුභ සාධනය, අධ්‍යාපනය හා පුහුණු කිරීම වැඩිදියුණු කිරීම ;

(5) පුවත්පත් නිෂ්පාදනයෙහි හෝ පළ කිරීමෙහි නියුක්ත සියලු අංශ අතර ක්‍රියා කිරීමේ නිසි සම්බන්ධතාවකට අනුබල දීම හා ප්‍රවෘත්ති සැපයීම හා පතුරුවා හැරීම සඳහා අවශ්‍ය බව කලින් කල පෙනියා හැකි පොදු සේවාවන් ඇති කිරීම ;

(6) පුවත්පත් භාවිතය හා පුවත්පත්වල අවශ්‍යතා පිළිබඳව පර්යේෂණ පැවැත්වීම ; පොදු යහපත සඳහා වූ හා පොදු වැදගත්කමින් යුත් තොරතුරු සැපයීම සීමා වීමට හේතු විය හැකි අලුත් තත්ත්වයන් හා ශ්‍රී ලංකාවේ පුවත්පත්වල ඇති වන එක්තැන් වීම හෝ ඒකාධිකාරි බවට පත් වීම කෙරෙහි නැඹුරු විය හැකි අලුත් තත්ත්වයන් සමාලෝචනයට භාජනව තැබීම ; හා ඒවා සම්බන්ධයෙන් ප්‍රතිකර්ම වශයෙන් සුදුසු ක්‍රියා මාර්ග යෝජනා කිරීම ;

(7) පුවත්පත් විධිමත් කිරීම හා පුවත්පත් පවත්වා ගෙන යාමට අදාළ කවර කරුණක් සම්බන්ධයෙන් වුවද රජයට අනුශාසනා කිරීම ;

යන මේවාය.

පුවත් පත්වලට හා කර්තෘවරුන් ආදීන්ට විරුද්ධව මණ්ඩලය විසින් ක්‍රියා කිරීම.

9. (1) මණ්ඩලය වෙත කරන ලද පැමිණිල්ලක් පිට හෝ එවැනි පැමිණිල්ලක් නොමැතිව හෝ අසත්‍ය වූ ප්‍රකාශයක් හෝ විකෘති කළ පින්තූරයක් හෝ අනිසි දෙයක් පුවත් පතක් විසින් පළ නොට ඇති බව හෝ පුවත් පතක කර්තෘවරයකු හෝ ක්‍රියාකාරී පත්‍ර කලාවේදියකු විසින් යම් වෘත්තීය විෂමාචාරයක් හෝ පත්‍ර කලාවේදී ආචාර ධර්ම සංග්‍රහය කඩ කිරීමක් සිදු කර ඇති බව විශ්වාස කිරීමට මණ්ඩලයට හේතු ඇති අවස්ථාවක, නියමිත ආකාරයට මණ්ඩලය විසින් විභාගයක් පැවැත්විය හැකි අතර කරුණු කියා සිටීමේ අවස්ථාවක් සම්බන්ධිත පුවත් පතට, අයිතිකරුට, මුද්‍රණ කරුට, ප්‍රකාශකට, කර්තෘට හෝ පත්‍ර කලාවේදියාට දීමෙන් පසු—

(අ) මණ්ඩලය විසින් අනුමත කරනු ලබන නිවැරදි කිරීමක් උචිත පුවත් පතෙහි පළ කරන ලෙස අණ කිරීම ; හෝ

(ආ) ඒ පුවත් පතෙහි අයිතිකරුට, මුද්‍රණකරුට, ප්‍රකාශකට, කර්තෘට, පත්‍ර කලාවේදියාට හෝ සෙසු නිලධරයාට හෝ බලධරයාට දෝෂාරෝපණය කිරීම ; හෝ

(ඇ) ඒ අයිතිකරු, මුද්‍රණකරු, ප්‍රකාශක, කර්තෘ, පුවත් පත් කලා වේදියා හෝ සෙසු නිලධරයා හෝ බලධරයා විසින් උචිත පාර්ශ්වයෙන් සමාව අයදින ලෙස අණ කිරීම

අවශ්‍ය බවට මණ්ඩලය සෑහීමට පත් වුවහොත් මණ්ඩලය විසින් එසේ කළ හැකි ය.

(2) මණ්ඩලය වෙත කරන ලද පැමිණිල්ලක් අනුව (1) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන යම් විභාගයක දී යම් පැමිණිල්ලක විෂය කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය සෑහීමට පත් කිරීමේ භාරය පැමිණිලිකරු කෙරෙහි විය යුතු ය. මණ්ඩලයේම ඔනෑකම අනුව ආරම්භ කරන ලද යම් විභාගයක දී මණ්ඩලයට එම විභාගය පැවැත්වීම අවශ්‍ය වූයේ යම් කරුණු මත ද ඒ කරුණු පිළිබඳ ප්‍රකාශයක් අවස්ථාවෝචිත පරිදි පුවත් පතට, අයිතිකරුට, මුද්‍රණකරුට, ප්‍රකාශකට, කර්තෘට හෝ පුවත් පත් කලාවේදියාට සැපයිය යුතු අතර එම කරුණු වැරදි බව ඔප්පු කිරීම සඳහා මණ්ඩලයේ මතය අනුව සාධාරණ අවස්ථාවක් ඒ තැනැත්තාට දෙනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් අණ කරනු ලබන සියලු නිවරද කිරීම්, සමාව අයැදීම් හා මණ්ඩලය විසින් කරනු ලැබූ දෝෂාරෝපණය කිරීම් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පුවත්පතක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට පළ කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් කිසිවකින්—

(අ) ඒ උපවගන්තියෙහි සඳහන් යම් කරුණක් නිසා පීඩනයට පත් යම් තැනැත්තකු විසින් ඒ පීඩාව සම්බන්ධයෙන් යම් අධිකරණයක නීති කෘත්‍යයක් පැවරීම හෝ පවත්වා ගෙන යාම වැළැක්වෙන ලෙස ; හෝ

(ආ) අධිකරණයක් ඉදිරියෙහි යම් නීති කෘත්‍යයක් පවත්නා යම් කරුණක් සම්බන්ධයෙන් විභාගයක් පැවැත්වීමට මණ්ඩලයට බලය පැවරෙන ලෙස

නොසැලකිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කෙරෙන මණ්ඩලයේ යම් අණක් හෝ දෝෂාරෝපණයක් අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර කිසිම අධිකරණයක දී එය ප්‍රශ්න නො කළ යුතු ය.

10. (1) මේ පනත යටතේ මණ්ඩලයට අයත් කටයුතු කිරීමේ කාර්යය සඳහා මණ්ඩලයට අවශ්‍ය යයි මණ්ඩලය විසින් සැලකිය හැකි කරුණු සම්බන්ධයෙන් යම් යම් වාර වාර්තා හා තොරතුරු මණ්ඩලය වෙත සපයන ලෙස යම් පුවත්පතක අයිතිකරුට, මුද්‍රණකරුට, ප්‍රකාශකට, කර්තෘට හෝ පුවත් පත් කලාවේදියාට නියම කිරීම ද ; මණ්ඩලයේ සාමාන්‍ය බලතල.

(2) පුවත්පත් කලාවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් නියම කිරීම ද ;

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව, එහි නිලධරයන් හා සේවකයන් සම්බන්ධයෙන්, ඔවුන්ගේ පත්වීම්, උසස්වීම්, පාරිශ්‍රමික, විනය පාලනය, සුභ සාධනය, පැවැත්ම හා ඔවුන්ට නිවාඩු දීම යන මේවා පිළිබඳව රීති සෑදීම ද;

(4) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ද;

(5) පුවත්පත්වල අයිතිය හා ධන සංයුතිය පිළිබඳ ගැදෑරීමක් ද ඇතුළත්ව, පුවත්පත්වල අයිතිය එක්තැන්වීමට හෝ ඒකාධිකාරිවීමට තැඹුරුවිය හැකි අලුත් තත්ත්වයන් හැදෑරීම හා ඒ සම්බන්ධයෙන් උචිත ක්‍රියා මාර්ග යෝජනා කිරීම ද;

(6) නියම කරනු ලැබිය හැකි විධිවිධානවලට අනුකූලව, අවශ්‍ය විය හැකි විභාග පැවැත්වීම ද;

(7) ශිල්පීය හෝ වෙනත් පර්යේෂණවලට අනුබල දීම ද;

(8) මේ පනතේ විධිවිධාන කඩ කිරීමක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග කඩ කිරීමක් සිදු වූ විට උචිත බලධාරීන්ගේ අවධානය එයට යොමු කිරීම ද;

(9) මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට හා මේ පනත යටතේ එහි බලතල ක්‍රියාවෙහි යෙදවීමට ආනුෂංගික හෝ වැඩ දායක විය හැකි වෙනත් කටයුතු කිරීම ද

මණ්ඩලය විසින් කළ හැකි ය.

මේ පනත යටතේ විභාග සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල.

**11.** මේ පනත යටතේ මණ්ඩලය විසින් පවත්වනු ලබන යම් විභාගයක කාර්යය සඳහා—

(අ) යම් තැනැත්තකු කැඳවීම හා පැමිණ සිටීමට ඔහුට බල කිරීම පිණිස ද;

(ආ) ලේඛන ඉදිරිපත් කිරීමට බල කිරීම පිණිස ද;

(ඇ) යම් තැනැත්තකු ලවා දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් කරවීම පිණිස ද,

දිසා අධිකරණයකට ඇති සියලු බලතල මණ්ඩලයට ඇත්තේ ය.

මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන විභාග හා සම්බන්ධ පනත යටතේ වැරදි.

**12.** (1) යම් තැනැත්තකු—

(අ) මණ්ඩලය විසින් යම් විභාගයක් පවත්වා ගෙන යන අතරතුර දී හෝ විභාගයක් පවත්වා අවසාන වීමෙන් පසු මණ්ඩලය හෝ එහි යම් සාමාජිකයකු අපකීර්තියට පත් කරන යම් ප්‍රකාශයක් සෑහෙන හේතු නොමැතිව පළ කරන හෝ එසේ වූ යම් දෙයක් සෑහෙන හේතු නොමැතිව කරන; හෝ

(ආ) ඒ මණ්ඩලයෙහි නීත්‍යානුකූල කාර්ය මාර්ගයට අයුතු ලෙස මැදිහත් වන; හෝ

(ඇ) මණ්ඩලය විසින් මේ පනත යටතේ විභාගයක් පවත්වන අතරතුර—

(i) මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන යම් කැඳවීම් නියෝගයක සඳහන් වේලාවේ දී හා ස්ථානයේ දී මණ්ඩලය ඉදිරියෙහි පෙනී සිටීම මණ්ඩලයේ මතය අනුව යුක්ති සහගත හේතුවක් නොමැතිව පැහැර හරින, හෝ

(ii) දිවුරවනු ලැබීම ප්‍රතික්ෂේප කරන හෝ යථා පරිදි දිවුරවනු ලැබීමෙන් පසු මණ්ඩලය විසින් විභාග කරනු ලබන කරුණු පිළිබඳව අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම මණ්ඩලයේ මතය අනුව යුක්ති සහගත හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන, හෝ

(iii) තම සන්තකයෙහි හෝ බලය යටතේ තිබෙන හා මණ්ඩලයේ මතය අනුව මණ්ඩලය විසින් විභාග කරනු ලබන කරුණු පිළිබඳ සත්‍යය සොයා ගැනීමට අවශ්‍ය වන යම් ලේඛනයක් හෝ අන්කිසි දෙයක් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම හෝ මණ්ඩලයට පෙන්වීම මණ්ඩලයේ මතය අනුව යුක්ති සහගත හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින

අවස්ථාවක ඒ තැනැත්තා මණ්ඩලයේ බලයට විරුද්ධ වීමේ හෝ අගෞරව කිරීමේ හෝ අපහාස වරදට වරදකරු විය යුතු ය.

(2) යම් තැනැත්තකු මණ්ඩලයේ බලයට විරුද්ධ වීමේ හෝ අගෞරව කිරීමේ (මෙහි (1) වන උපවගන්තියේ සඳහන්) යම් අපහාස වරදක් කර ඇති බව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක එම නිශ්චය කිරීම සවිස්තරව දැක්වෙන සහතිකයක් මණ්ඩලයේ ලේකම් ලවා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යැවීමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය හැකි ය; ඒ සෑම සහතිකයක් මණ්ඩලයේ සභාපති විසින් අත්සන් කළ යුතු ය.

(3) මෙහි පහත (5) වන උපවගන්තියේ විධිවිධාන සැලසෙන පරිදි සැලකිල්ලට ගැනීම යෝග්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණය සලකන යම් අපහාස වරදකට දඬුවම් පැමිණවීම සඳහා වූ යම් නීති කෘත්‍යයක දී (2) වන උපවගන්තිය යටතේ අත්සන් කර අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති සහතිකයක් යයි සැලකෙන යම් ලේඛනයක්—

(අ) සාක්ෂි වශයෙන් පිළි ගනු ලැබිය යුතු අතර එය එවැනි සහතිකයක් නොවන බව ඔප්පු කරනු ලැබුවහොත් මිස තවදුරටත් ඔප්පු කිරීමක් නොමැතිව ම එවැනි සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය; තවද,

(ආ) ඒ සහතිකයේ දැක්වෙන නිශ්චය කිරීම මණ්ඩලය විසින් කරන ලද බවට ද එම නිශ්චයෙහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් ද තීරණාත්මක සාක්ෂි විය යුතු ය.

(4) මණ්ඩලයේ බලයට විරුද්ධ වීමෙන් හෝ අගෞරව කිරීමෙන් කරන ලදැයි කියනු ලබන්නා වූ අපහාස වරදක් පිළිබඳව මෙහි පහත (5) වන උපවගන්තියේ විධිවිධාන පරිදි ආරම්භ කරනු ලබන යම්

නීති කෘත්‍යයකදී මණ්ඩලයේ කිසි ම සාමාජිකයකු ඔහුගේ කැමැත්ත ඇති ව මිස සාක්ෂිකරුවකු වශයෙන් කැඳවීම හෝ පරීක්ෂා කිරීම හෝ නොකළ යුතු ය.

(5) මණ්ඩලයේ බලයට විරුද්ධ වීමෙන් හෝ අගෞරව කිරීමෙන් කරන ලද සෑම අපහාස වරදක් සඳහා, එම වරද ශ්‍රේෂ්ඨාධිකරණයේ බලයට විරුද්ධ වීමෙන් හෝ අගෞරව කිරීමෙන් කරන ලද අපහාස වරදක් වූවාක් මෙන් අධිකරණ ආඥාපනතේ 47 වන වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ එහි යම් විනිශ්චයකාරවරයකු විසින් දඬුවම් කළ හැකි විය යුතු ය.

අධි. 6.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

**13.** පුද්ගල මණ්ඩලයක් විසින් කරන ලද මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වූ විට—

(අ) පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු සහ නිලධරයකු යන මේ එක් එක් තැනැත්තා එම වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය; තවද,

(ආ) පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් එම ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු එම වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, වරද කර ඇත්තේ තමාගේ දැනුම නොමැතිව බව හෝ එම වරද කිරීම වැළැක්වීමට නිසි සියලු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව එවැනි යම් තැනැත්තකු ඔප්පු කරනහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස නොසැලකිය යුතුය.

පුවත් පතක් මගින් කරනු ලබන වැරදි සම්බන්ධයෙන් වග කිව යුතු තැනැත්තෝ.

**14.** මේ පනත යටතේ වූ වරදක් පුවත් පතක් මගින් කරනු ලැබූ විට ඒ පුවත් පතෙහි අයිතිකරු, ප්‍රකාශක, මුද්‍රණකරු, කර්තෘ සහ පත්‍ර කලාවේදී යන මේ එක් එක් තැනැත්තා එම වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, වරද කර ඇත්තේ තමාගේ දැනුම නොමැතිව බව හෝ එම වරද කිරීම වැළැක්වීමට නිසි සියලු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව එකී යම් තැනැත්තකු ඔප්පු කරනහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

ඇතැම් සාපරාධ පළ කිරීම.

**15.** (1) යම් පුවත් පතක—

(අ) යම් අසත්‍ය කරුණක්; හෝ

අධි. 19.

(ආ) දණ්ඩ නීති සංග්‍රහයෙහි 479 වන වගන්තියෙහි අර්ථානුකූලව යම් තැනැත්තකුට අපකීර්තියක් කරන ලෙස ගණන් ගැනෙන ඒ තැනැත්තා පිළිබඳ යම් ප්‍රකාශයක් හෝ කරුණක්; හෝ

(ඇ) මහජන සදාචාරයට හානිකර වීමට අදහස් කරන ලද යම් වෙළඳ දැන්වීමක්; හෝ

(ඇ) යම් අශෝභන හෝ අශ්ලීල ප්‍රකාශයක් හෝ කරුණක්,

පළ කරන හෝ පළ කිරීමට සලස්වන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් දහසකට නොවැඩි දඩයකින් හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකෙන් ම දඬුවම් කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

(2) මේ වගන්තියෙහි කාර්යයන් සඳහා—

(අ) "අසභ්‍ය" යන්නෙන්—

(i) යම් ආගමක් හෝ යම් ආගමක ආදි කර්තෘවරයා ;

(ii) යම් ආගමක අනුගාමිකයන් විසින් පුදනු ලබන යම් දෙවිවරයකු හෝ සාන්තුවරයකු

නින්දාවට පත් කිරීමේ අභිප්‍රායෙන් වූ යම් කරුණක් අදහස් වේ ; තවද

(ආ) "අශෝභන හෝ අශ්ලීල ප්‍රකාශය හෝ කරුණ" යන්න අදාළ සියලු කරුණු සැලකිල්ලට ගත් කල්හි, එම ප්‍රකාශය හෝ කරුණ කියවන හෝ බලන තැනැත්තකු කෙලෙසීමට හෝ දූෂණයට පත්වීමට ඉඩ ඇති යම් ප්‍රකාශයක් හෝ කරුණක් ලෙස සැලකිය යුතු ය.

16. (1) අමාත්‍ය මණ්ඩලයේ රැස්වීමක කටයුතු යයි හෝ ඒ කටයුතුවල යම් කොටසක් යයි සැලකෙන කිසි ම කරුණක් කිසි ම තැනැත්තකු විසින් කිසි ම පුවත් පතක පළකිරීම හෝ පළකරවීම නොකළ යුතු ය. අමාත්‍ය මණ්ඩලයේ තීරණ ආදිය පිළිබඳ ඇතැම් කරුණු පළ කිරීම.

(2) (අ) යම් අමාත්‍යවරයකු විසින් හෝ සියලු ම අමාත්‍යවරයන් විසින් හෝ යම් අමාත්‍යවරයකුට හෝ සියලුම අමාත්‍ය වරයන්ට හෝ අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට හෝ එම ලේකම් විසින් යවන ලද යම් ලියවිල්ලක අඩංගු දේ යයි හෝ අඩංගු දේවල යම් කොටසකැයි සැලකෙන යම් කරුණක් ; හෝ

(ආ) අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් යයි හෝ තීරණයක යම් කොටසක් යයි හෝ සැලකෙන යම් කරුණක්

පුවත්පත්වල පළකිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් අනුමත කරනු ලැබ ඇතොත් මිස කිසි ම තැනැත්තකු විසින් කිසි ම පුවත් පතක පළ කිරීම හෝ පළ කරවීම නොකළ යුතු ය.

(3) නිල රහස් පනතේ අර්ථානුකූල වූ යම් නිල රහසක් හෝ යුද්ධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා හෝ පොලිස් ආයතන, උපකරණ හෝ සවිකිරීම් ආදිය සම්බන්ධයෙන් වූ ශ්‍රී ලංකා ජනරජයේ ආරක්ෂාවට සහ සුරක්ෂිත භාවයට හානිකර විය හැකි යම් කරුණක්, ඒ කරුණ පුවත්පත්වල පළ කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂා විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබ ඇතහොත් මිස කිසි ම තැනැත්තකු විසින් කිසි ම පුවත් පතක පළ කිරීම හෝ පළ කරවීම නොකළ යුතු ය. අධි. 39.

(4) ආණ්ඩුව විසින් හෝ යම් අමාත්‍යාංශයක් විසින් හෝ ශ්‍රී ලංකා මහා බැංකුව විසින් හෝ සැලකිල්ලට භාජන කරනු ලබමින් පවතී නැයි කියනු ලබන මූල්‍ය, ආදායම් ප්‍රතිපත්තිමය, විනිමය පාලන හෝ ආනයන පාලන ක්‍රියා මාර්ග පිළිබඳවූත් පළ කිරීමෙන් බඩු හිඟයක් ඇති වීමට හෝ හදිසි විශාල ලාභ ඇතිවීමට හෝ ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි වෙනත් අයුරින් හානිකරව බලපෑමට හෝ ඉඩ සැලසෙතියි සිතිය හැකි යම් ප්‍රකාශයක්, එය පුවත් පත්වල පළ කිරීමට අදාළ විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබ ඇතහොත් මිස කිසි ම තැනැත්තකු විසින් කිසි ම පුවත් පතක පළ කිරීම හෝ පළ කරවීම නොකළ යුතු ය.

(5) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට යටත්ව, යම් අමාත්‍යවරයකුගේ හෝ අමාත්‍යාංශයක හෝ ආණ්ඩුවේ හෝ සැලකිල්ලට භාජනව පවතිනැයි කියනු ලබන යම් යෝජනාවක් හෝ අන් කරුණක් එසේ ඒ අමාත්‍යවරයාගේ, අමාත්‍යාංශයේ හෝ ආණ්ඩුවේ සැලකිල්ලට එය භාජනව පවතින බව අසත්‍ය විට කිසි ම තැනැත්තකු විසින් කිසි ම ප්‍රවෘත්ති පත්‍රයක පළ කිරීම හෝ පළ කරවීම නොකළ යුතු ය. මේ උපවගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වූ යම් නඩුවක දී එසේ පළ කරන ලද එකී යම් යෝජනාවක් හෝ අන් කරුණක් අසත්‍ය බව ඔප්පු කිරීමේ භාරය චෝදක පක්ෂය කෙරෙහි විය යුතු ය.

(6) මේ වගන්තියේ—

(අ) "අමාත්‍ය මණ්ඩලය" යන්නට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අමාත්‍යවරයන්ගේ කාරක සභාවක් ඇතුළත් වේ;

(ආ) "ආණ්ඩුව" යන්නෙන් අමාත්‍ය මණ්ඩලය අදහස් වේ;

(ඇ) "අමාත්‍ය මණ්ඩලයේ ලේකම්" යන්නට මේ වගන්තියේ කාර්යයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් ලිය විල්ලකින් බලය පවරන ලද නිලධරයෙක් ඇතුළත් වේ.

(7) මේ වගන්තියේ විධිවිධාන අතුරින් කිසිවක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකින් හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකින් ම දඬුවම් කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීම.

**17.** මණ්ඩලය ඉදිරියේ පැවැත්වෙන විභාගයක යම් නීතිකෘත්‍ය යක දී කොමසාරිස්වරයාට හෝ වගඋත්තරකරුට පෞද්ගලිකව හෝ උත්තරවාදියකු මගින් නැතහොත් යථා පරිදි ලියවිල්ලකින් බලය පවරන ලද අනුයෝජිතයකු මගින් පෙනී සිටිය හැකි ය.

මේ වගන්තියේ කාර්යයන් සඳහා "උත්තර වාදියා" යන්නෙන් අධිනීතිඥයෙක් හෝ නීතිඥයෙක් අදහස් වේ.

දඩ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව.

**18.** මේ පනත යටතේ දඩ වශයෙන් ගෙවනු ලබන හෝ අය කරගනු ලබන සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

## II වන කොටස

### මුදල්

19. (1) මණ්ඩලයට මණ්ඩලයේ ම අරමුදලක් තිබිය යුතු ය. මණ්ඩලයේ අරමුදල.

(2) මණ්ඩලයේ අරමුදලට පහත දැක්වෙන මුදල් ගෙවිය යුතුය :—

(අ) මණ්ඩලයේ පරිහරණය සඳහා ජාතික රාජ්‍ය සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුකූලව පුවත් පත් අයිතිකරුවන්ගෙන් අය කර ගනු ලැබිය හැකි ලියා පදිංචි කිරීමේ ගාස්තු ඇතුළු, මණ්ඩලයේ කාර්යයන් කිරීමේ දී බලතල පාවිච්චි කිරීමේ දී සහ යුතුකම් ඉටු කිරීමේ දී මණ්ඩලයට ලැබෙන්නා වූ සියලු මුදල් ; තවද

(ඇ) කවර වූ හෝ මාර්ගයකින් ලැබෙන පිරිනැමීම්, තෑගි හෝ ප්‍රදාන.

(3) මණ්ඩලයේ කාර්යයන් කිරීමේ දී, බලතල පාවිච්චි කිරීමේ දී සහ යුතුකම් ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් සඳහා ගෙවිය යුතු සියලු මුදල් සහ මේ පනතින් හෝ මේ පනත යටතේ ගෙවීමට නියමිත සියලු මුදල් මණ්ඩලයේ අරමුදලින් ගෙවිය යුතු ය.

20. මණ්ඩලයේ මුදල් පාලනය හා ගණන් සම්බන්ධයෙන් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය. 1971 අංක 38 දරන මුදල් පනතෙහි විධිවිධාන අදාළ කිරීම.

21. මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මණ්ඩලයේ මුදල් වර්ෂය.

## III වන කොටස

### පොදු විධිවිධාන

22. (1) මේ පනතේ කාර්යයන් සඳහා මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු පුවත් පත් කොමසාරිස්වරයකු පත් කළ හැකි ය. පුවත් පත් කොමසාරිස් වරයා පත් කිරීම.

(2) කොමසාරිස්වරයා මණ්ඩලයේ සාමාන්‍ය විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) සභාවේ උපදෙස් අනුව සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුපක් හා දීමනා කොමසාරිස්වරයාට ගෙවනු ලැබිය හැකි ය.

23. (1) මේ වගන්තියෙහි පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව, මේ පනතෙහි කාර්යයන් සඳහා, අවශ්‍ය යයි මණ්ඩලය විසින් සැලකිය හැකි නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් පත් කළ හැකි ය. කාර්ය මණ්ඩලය පත් කිරීම.

(2) රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කළ හැකි කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ හා එකී ලේකම්ගේ කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) 1957 අංක 48 දරන මෝටර් ගමනා ගමන පනතෙහි 9 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු අතර, ඉහත කී 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි යොදවා ගනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ කොමිෂන් සභාවේ හෝ ආයතනයේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියමයන් ද ඇතුළුව එම මණ්ඩලය හා ඒ කොමිෂන් සභාව හෝ ආයතනය විසින් ගිවිස ගනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසි පිට අවස්ථාවෝචිත පරිදි අදාළ කැමැත්ත ඇතිව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) පළාත් පාලන සේවයෙහි යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක ඒ කාර්ය මණ්ඩලයේ අන් කිසි සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් විය යුතු ය.

විධානවලට අනුකූලව ක්‍රියා කිරීම.

24. මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් හෝ අනුව අමාත්‍යවරයා විසින් මණ්ඩලයට දෙනු ලබන සාමාන්‍ය විධානවලට අනුකූලව මණ්ඩලය ක්‍රියා කළ යුතු ය.

25. පුවත්පත් අයිතිකරුවන් හා කර්තෘවරුන් ඔවුන්ගේ පුවත් පත් සම්බන්ධයෙන් මේ පනත යටතේ ලියා පදිංචි කිරීම සඳහා ද එසේ ලියා පදිංචි කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීම සඳහා ද නියෝග සාදනු ලැබිය හැකි ය.

ලියාපදිංචි කිරීම හා ලියාපදිංචි කිරීමේ ගාස්තු පිළිබඳ නියෝගය.

26. මේ පනතේ කාර්යයන් සඳහා, සෑම පුවත් පතක ම මුද්‍රණකරු සහ ප්‍රකාශක විසින් ඒ පුවත් පත පළ කරනු ලබන එක් එක් දිනයෙහි දී හෝ නිවාඩු දිනයක් නොවන ඊළඟ දිනයෙහි දී, ඒ පුවත් පතෙහි පිටපතක් සහ ඒ පුවත් පතෙහි එසේ මුද්‍රණය කරනු ලබන හෝ පළ කරනු ලබන සෑම තදනන්තර සහ අන්‍යාකාර මුද්‍රණයක හෝ මුද්‍රණාංකයක පිටපතක් කොමසාරිස්වරයාගේ කාර්යාලයට භාර දීමට සැලැස්විය යුතු ය. තවද මුද්‍රණකරුගේ හෝ ප්‍රකාශකගේ නම සහ පදිංචි ස්ථානය එහි මුද්‍රණය කිරීමෙන් පසු, ඔහු විසින් තම අත් අකුරින් තම නම සහ පදිංචි ස්ථානය ලියා තම පුරුදු අත්සන එහි යොදා තිබිය යුතු ය. නැතහොත් තත් කාර්යය සඳහා ඔහු විසින් පත් කරන ලද හෝ බලය පවරන ලද යම් තැනැත්තකු විසින් එහි එසේ කළ යුතු ය. ඒ තැනැත්තාගේ පත් කිරීම සහ ඔහුට බලය පැවරීම ඒ මුද්‍රණකරු හෝ ප්‍රකාශක විසින් අත්සන් කරනු ලැබූ ලියවිල්ලකින් කොමසාරිස්වරයා වෙත යථා පරිදි දැනුම් දිය යුතු ය.

පුවත් පත් මුද්‍රණකරුගේ සහ ප්‍රකාශකගේ යුතුකම්.

27. මණ්ඩලයේ සාමාජිකයකු විසින් හෝ මේ පනතේ කාර්යයන් සඳහා පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව සිවිල් හෝ අපරාධ නීතිකෘත්‍යයක් නොපැවරිය යුතු ය.

මේ පනත යටතේ කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් ආරක්ෂා කිරීම.

28. මණ්ඩලයේ සියලු ම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි කාර්යයන් සඳහා සහ එහි අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සැලකිය යුතු ය.

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සැලකිය යුතු බව. අධි. 19.

29. මණ්ඩලය අල්ලස් පනතෙහි අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

මණ්ඩලය අල්ලස් පනතෙහි අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව. අධි. 26.

30. (1) මණ්ඩලය විසින්—

රීති හා නියෝග.

(අ) පුවත් පත් කලාවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් නියම කරමින් ; සහ

(ආ) මණ්ඩලයේ කටයුතු පරිපාලනය පිළිබඳව

රීති සාදනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමේ සහ විධිවිධාන බල ගැන්වීමේ කාර්ය සඳහා ද, නියම කරනු ලැබීමට මේ පනතින්

නියමිත හෝ මේ පනතින් නියෝග අවශ්‍ය වන නැතහොත් නියෝග සෑදීමට මේ පනතින් බලය පවරා ඇති සියලු කරුණු සඳහා ද අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සෑම රීතියක් ම හෝ නියෝගයක් ම අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු ලබන සෑම රීතියක් ම හෝ නියෝගයක් ම එම අනුමතය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දින සිට හෝ එම නිවේදනයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට, මෙහි ලා පනවනු ලැබ ඇත්තාක් මෙන් වලංගුව බල පැවැත්වෙන ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ වැරදි.

31. මණ්ඩලයේ යම් නීත්‍යනුකූල නියමයකට අවනත නොවන හෝ අන් කිසි ආකාරයකින් මේ පනතේ විධිවිධාන කිසිවක් කඩ කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගය කින් පසු වරදකරු කරනු ලැබූ විට, මේ පනතෙහි අන් ආකාරයක විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, රුපියල් එක් දහසක දඩයකට හෝ අවුරුද්දක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

තොරතුරු ලැබුණු මාර්ගය හෙළි කිරීම.

32. (1) යම් පුවත්පතක පළ කර ඇති යම් ප්‍රවෘත්තියකට අදාළ තොරතුරු ලැබුණු මාර්ගය හෙළි කිරීමට මේ පනතේ ඇතුළත් කිසිවකින්, කිසිම පුවත්පතකට, පුවත්පතක අයිතිකරුට, මුද්‍රණකරුට, ප්‍රකාශකට, කර්තෘට හෝ පත්‍ර කලාවේදියකුට නියම කෙරෙන සේ නො සැලකිය යුතු ය.

(2) 9 වන වගන්තිය යටතේ පැවැත්වෙන විභාගයක දී හෝ 16 (5) වන වගන්තිය යටතේ පවරන ලද නඩුවක දී විත්තිවාචක වශයෙන්, එකී යම් ප්‍රවෘත්තියකට අදාළ තොරතුරු ලැබුණු මාර්ගය යම් පුවත් පතක්, පුවත් පතක අයිතිකරු, මුද්‍රණකරු, ප්‍රකාශක, කර්තෘ හෝ පත්‍ර කලාවේදියකු විසින් හෙළි කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන, වෙනත් යම් කිසි නීතියක් කෙරෙහි හෝ වෙනත් යම් කිසි නීතියක විධිවිධාන යටතේ යම් පුවත් පතක්, පුවත් පතක අයිතිකරුවකු, මුද්‍රණකරු, ප්‍රකාශක, කර්තෘ හෝ පත්‍ර කලාවේදියකු හා සම්බන්ධයෙන් පැවැත්වෙන නීති කෘත්‍යයක් කෙරෙහි හෝ අදාළ නොවිය යුතු ය.

අර්ථ නිරූපණය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"කොමසාරිස්වරයා" යන්නෙන් මේ පනත යටතේ පත් කෙරෙන පුවත් පත් කොමසාරිස්වරයා අදහස් කෙරෙන අතර මේ පනත යටතේ පැවැත්වෙන විභාග හා මණ්ඩලය ඉදිරියෙහි පැවැත්වෙන නීතිකෘත්‍ය සම්බන්ධයෙන් වූ විට කොමසාරිස්වරයා විසින් ඒ සඳහා බලය පවරන ලද යම් නිලධරයෙක් ඊට ඇතුළත් වේ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබූ බව අදහස් වේ;

"පුවත් පත" යන්නෙන් පොදු පුවත්, ආරංචි හෝ සිදුවීම් ඇතුළත් කොට ශ්‍රී ලංකාවෙහි මුද්‍රණය කරනු ලබන හෝ පළ කරනු ලබන යම් පත්‍රයක් අදහස් වේ. එහෙත් ආණ්ඩුවේ බලය යටතේ මුද්‍රණය කර පළ කරනු ලබන යම් ප්‍රකාශනයක්, දැන්වීමක් හෝ වෙනත් රාජ්‍ය ලේඛනයක් හෝ පවත්නා මිල ගණන් ලැයිස්තු හෝ වෙළඳ පොළවල තත්ත්වය හෝ වෙළඳ නැව්වල හෝ යාත්‍රාවල පැමිණීම, පිටත් වීම හෝ එම නැව් හෝ යාත්‍රාවලට අදාළ වෙනත් කරුණු පිළිබඳ විස්තර හෝ වාණිජ හෝ ඊට සමාන ස්වභාවයේ වෙළඳ දැන්වීම් හෝ ගැසට් පත්‍රයෙහි කලින් පළ කරනු ලැබූ දැන්වීම් යන මේවා පමණක් අඩංගු යම් ලේඛනයක් එයට ඇතුළත් නො වේ.

34. අන් කිසි ලිඛිත නීතියක කුමක් ඇතුළත් ව ඇත ද මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු අතර, ඒ අනුව මේ පනතෙහි විධිවිධාන හා ඒ අන් නීතියෙහි විධිවිධාන හා අතර යම් ගැටුමක් හෝ නො ගැලපීමක් ඇති වූ විට මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිබවා බල පැවැත්විය යුතු බව.